(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

**අංක 67.]**

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2016 මැයි මස 05 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** විදේශ රැකියා අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **චන්දිම වීරක්කොඩි මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත රන්ගේ බණ්ඩාර මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුනේෂ් ගන්කන්ද මහතා,** ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා,** වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරානාත් බස්නායක මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **සිසිර කුමාර අබේසේකර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **දිළුම් අමුණුගම මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **රංජිත් අලුවිහාරේ මහතා**

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**

ගරු **වේලු කුමාර් මහතා**

ගරු **නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**

ගරු **චන්ද්‍රසිරි ගජදීර මහතා**

ගරු **චන්දිම ගමගේ මහතා**

ගරු **සිරිපාල ගමලත් මහතා**

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු තිලක් මාරපන මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු චමින්ද්‍ර විජේසිරි මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු එස්. වියාලේන්දිරන් මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු **ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

ගරු **ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

ගරු **ජයන්ත සමරවීර මහතා**

ගරු **රාජවරෝදියම් සම්පන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **ඊ. සරවනපවන් මහතා**

ගරු **එම්. එච්. එම්. සල්මාන් මහතා**

ගරු **ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

ගරු **(වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**

ගරු **සිවශක්ති ආනන්දන් මහතා**

ගරු **එම්. ඒ. සුමන්තිරන් මහතා**

ගරු **වඩිවේල් සුරේෂ් මහතා**

ගරු **අලී සාහීර් මවුලානා සෙය්යිඩ් මහතා**

ගරු **මාවෛ සෝ. සේනාධිරාජා මහතා**

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා**

ගරු **විජේපාල හෙට්ටිආරච්චි මහතා**

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

ගරු **කනක හේරත් මහතා**

ගරු **විජිත හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. කථානායකතුමාගේ නිවේදන :** කථානායකතුමා විසින් මතු පළවන නිවේදනය කරන ලදී,—

"2016 මැයි මස 03 වැනි අඟහරුවාදා පාර්ලිමේන්තුවේ සභා ගර්භය තුළදී සිදු වූ කනගාටුදායක සිද්ධිය සම්බන්ධයෙන් නිවේදනයක් කිරීමට කැමැත්තෙමි.

මෙවැනි අශෝභන සිද්ධීන් හේතු කොට ගෙන පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවයට සහ මෙම සභාවේ ගෞරවයට හානි සිදු වන අතර, මහජනතාවගේ දැඩි අප්‍රසාදයට අප පාර්ලිමේන්තුව භාජනය වන බව නොඅනුමානයි.

එවැනි අවස්ථාවලදී පාර්ලිමේන්තුවට මෙන්ම ගරු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාවට ද විශාල තර්ජනයක් එල්ල වන බැවින්, අනාගතයේදී කිසිදු හෝ ආකාරයකින් මෙවැනි සිද්ධීන් ඇති නොවන බවට වගබලා ගැනීම ජනතා නියෝජිතයින් වශයෙන් අප සියලු දෙනාගේම යුතුකම හා වගකීම බව මම අවධාරණය කරමි.

මෙම සභාවට මා විසින් ඊයේ අපර භාගයේදී දැනුම් දුන් පරිදි නියෝජ්‍ය කථානායක, ගරු තිලංග සුමතිපාල මැතිතුමා සහ නියෝජ්‍ය කාරක සභාපති, ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මැතිතුමා විසින් එකී සිද්ධියට අදාළ කරුණු පරීක්ෂා කර බලා මා වෙත වාර්තාවක් ලබා දී ඇත. සියලුම මන්ත්‍රීවරුන්ට එම වාර්තාවේ පිටපතක් ලබා දීමට ද කටයුතු කරමි.

මෙවැනි සිද්ධීන් නැවත වරක් ඇති නොවීම තහවුරු කිරීමටත්, මෙම සභාවේ චිරාත් කාලයක සිට පැවත එන උතුම් සම්ප්‍රදායයන් ආරක්ෂා කර ගැනීමටත්, පාර්ලිමේන්තුවේ සහ ගරු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහාත්, සභාවේ විනය පවත්වා ගැනීමටත් පියවර ගත යුතු බව සභාවේ අවධානයට යොමු කරවමි.

අදාළ නිරීක්ෂණයන්ට අනුව මෙම සිද්ධිය ආරම්භ වීමට මූලික හේතුව වූයේ විරුද්ධ පාර්ශ්වයේ අසුන් ගෙන සිටි මන්ත්‍රීවරුන් කණ්ඩායමක් සභා ගර්භයට පිවිස පාර්ලිමේන්තුවේ කටයුතුවලට ඝෝෂා කරමින් බාධා පැමිණවීමයි. ඉන් අනතුරුව ආණ්ඩු පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් කණ්ඩායමක් ද සභා ගර්භයට පිවිසීමෙන් ඇති වූ කලහකාරී තත්ත්වය නිසා මෙම කනගාටුදායක බරපතළ සිද්ධිය ඇති වූ බව සඳහන් කරමි.

මෙම සියලු සිද්ධීන්වලට සම්බන්ධ මන්ත්‍රීවරුන්ගේ ක්‍රියා කලාපය මා දැඩි දෝෂ දර්ශනයට ලක් කරන අතර, මින් ඉදිරියට එබඳු සිද්ධීන් සිදු කර මෙම උත්තරීතර සභාවේ ගෞරවයට හානිවන ආකාරයේ කටයුතු කිරීමෙන් වැළකී සිටින ලෙසත්, පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායයන් හා වරප්‍රසාද නොපිරිහෙළා ආරක්ෂා කරන ලෙසත් මම අවධාරණය කරමි.

මෙම සිද්ධියට වගකිව යුතු මන්ත්‍රීවරුන් අතරින් වඩාත් බරපතළ ලෙස විනය විරෝධීව හැසිරී ඇති බවට නිරීක්ෂණය කරන ලද ගරු පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා සහ ගරු ප්‍රසන්න රණවීර මහතා යන මන්ත්‍රීවරුන් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 74 (2) සමඟ කියවිය යුතු 72(1) ස්ථාවර නියෝගය යටතේ එකී මන්ත්‍රීවරුන්ගේ පාර්ලිමේන්තු සේවය එක් සතියක කාලයකට තාවකාලිකව අත් හිටුවීමට අවශ්‍ය යෝජනාවක් මෙම සභාවට ඉදිරිපත් කරන ලෙස සභානායකතුමාගෙන් මම ඉල්ලා සිටිමි.''

**2. පාර්ලිමේන්තු සේවය අත්හිටුවීම :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2016 මැයි මස 03 වැනි දින සභාවේදී බරපතල ලෙස විනය විරෝධීව හැසිරීම සම්බන්ධයෙන් ගරු පාලිත කුමාර තෙවරප්පෙරුම මහතාගේ පාර්ලිමේන්තු සේවය එක් සතියක කාලයකට තාවකාලිකව අත්හිටුවීමට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 74(2) සමඟ කියැවෙන 72(1) ස්ථාවර නියෝගය ප්‍රකාරව කථානායකවරයා විසින් නම් කරන ලදුව, ගරු පාලිත කුමාර තෙවරප්පෙරුම මහතාගේ පාර්ලිමේන්තු සේවය එක් සතියක කාලයකට තාවකාලිකව තහනම් කළ යුතුය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. පාර්ලිමේන්තු සේවය අත්හිටුවීම :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2016 මැයි මස 03 වැනි දින සභාවේදී බරපතල ලෙස විනය විරෝධීව හැසිරීම සම්බන්ධයෙන් ගරු ප්‍රසන්න රණවීර මහතාගේ පාර්ලිමේන්තු සේවය එක් සතියක කාලයකට තාවකාලිකව අත්හිටුවීමට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 74(2) සමඟ කියැවෙන 72(1) ස්ථාවර නියෝගය ප්‍රකාරව කථානායකවරයා විසින් නම් කරන ලදුව, ගරු ප්‍රසන්න රණවීර මහතාගේ පාර්ලිමේන්තු සේවය එක් සතියක කාලයකට තාවකාලිකව තහනම් කළ යුතුය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව සහ

ගිණුම් පිළිගන්වා, එම වාර්තාව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්,—

(i) 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2012 වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව

පිළිගන්වා එම වාර්තා අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව පිළිගන්වන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතුයැයි නියෝග කරන ලදී.

(4) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2013 වර්ෂය සඳහා රබර් පර්යේෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් —

(i) 2014 වර්ෂය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2014 වර්ෂය සඳහා ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව

පිළිගන්වා එම වාර්තා අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. පෙත්සම් :**

(1) (i) තලවත්තේගෙදර, බටගම්මන යන ලිපිනයෙහි පදිංචි ආර්. එම්. චන්ද්‍රසිරි රාජපක්ෂ මහතාගෙන් ලැබුණු 2015.09.27 දිනැති පෙත්සම; සහ

(ii) තලාතුඔය, මහ / හේවාහැට මධ්‍ය විද්‍යාලයේ සේවය කරන ඩබ්ලිව්. එම්. ඒ. විජේසුන්දර මහතාගෙන් ලැබුණු 2015.10.05 දිනැති පෙත්සම

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) පල්ලම, වෙන්දකඩුව යන ලිපිනයෙහි පදිංචි පී. බී. නිශාන්ත ප්‍රියදර්ශන ද සිල්වා මහතාගෙන් ලැබුණු 2016.01.17 දිනැති පෙත්සම; සහ

(ii) කඩවත, ඉහළ කරගහමුණ, රාජසිංහ මාවත, අංක 348/30 දරන ස්ථානයෙහි පදිංචි යූ.ජී ගාමිණී රත්නසිරි මහතාගෙන් ලැබුණු 2016.02.14 දිනැති පෙත්සම

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**6. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය, ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"බී. වයි. තුඩාවේ සමාජ සත්කාරක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**7. පරිපූරක මුදල — ශීර්ෂය 240 — වැඩසටහන 2 :** මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මුදල් රාජ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— † 2016 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භ වන හා 2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය විසින් ලබාගන්නා ලද ණය මුදලකින් මාරු කරන ලද හෝ මුදලින් රුපියල් මිලියන පනස් පහක් නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු ය.

මෙහි උපලේඛනයේ දක්වා ඇති සේවාවන් වෙනුවෙන්

(අ) 2015 මුදල් වර්ෂය සඳහා හදිසි අවස්ථා අරමුදලින් ලබාගත් අත්තිකාරම් අංක 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10 හා 11 පියවීම.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| ශීර්ෂය | 240 - | ජාතික අයවැය දෙපාර්තමේන්තුව |
| වැඩ සටහන | 2 - | සංවර්ධන වැඩසටහන |
| ව්‍යාපෘතිය | 3 - | ගිණුම්කරණ සහායන් |
| | | මුළු වියදම = රු. **55,000,000** |

(රුපියල් මිලියන පනස් පහක් පමණි.)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2016 මාර්තු මස 24 වැනි දින ඉදිරිපත් කරන ලද 2016 අංක 01 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

(පූ. භා. 11.38 ට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.)

(අ. භා. 1.30 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

"ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය"යි උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 2.05 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

"ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.00 ට ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය"යි පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.46 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව 43 වන ස්ථාවර නියෝගය අනුව පක්ෂව 33; විරුද්ධව 31 යනුවෙන් බෙදී, සභා සම්මත විය.

**8. කල් තැබීම :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය; අ. භා. 5.59 ට 2016 මාර්තු මස 08 වැනි දින සභා සම්මතිය අනුව 2016 මැයි මස 06 වැනි සිකුරාදා පූ. භා. 10.30 වන තෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.